පසුගිය දා පැවැත්වුණු 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේදී ඇතැම් ප්‍රදේශයන් හිදී යම් අසාධාරණයන් සිදුවූ බවට දරුදැරියන් මාධ්‍ය වෙත දැක්වූ අදහස් ප්‍රකාශය කිරීමේදී අප නිරීක්ෂණය කළ ගැටළුකාරී තත්වයන් පිළිබඳව අප මින් පෙරද පාඨක අවධානය යොමු කරන්නට යෙදුණෙමු.

ඒ සම්බන්ධයෙන්, "ශිෂ්‍යත්වයට ගිය දරුවන්ට කඳුළු දුන් නරුම ගුරුවරු" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා ලංකාදීප පුවත්පතේ ද (ජනවාරි 30, 2022) ලිපියක් පළවී තිබිණි. එහිද "ශාලාවේ හිටියේ මුස්ලිම් ටීචර්ලා, අපිට ඒ භාෂාව එකපාරටම තේරෙන්නෙ නැහැ, මුස්ලිම් ළමයි තුන්දෙනෙක් හිටියා, ඒ තුන්දෙනාට අර ටීචර්ලා උත්තර පවා කියාදුන්නා" යනුවෙන් සඳහන්ව තිබිණි.

යුනිසෙෆ් සහ අධ්‍යාපන ලේඛක සංගමය වැනි ආයතන මගින් දරුවන් සම්බන්ධ වාර්තාකරණයන් සඳහා මාධ්‍යකරණ මාර්ගෝපදේශයන් හඳුන්වා දී තිබේ (උදා: Guidelines for journalists reporting on children). ඒවාට අනුව, විශේෂයෙන්ම ආතතිකාරී මානසික තත්වයක පසුවන දරුවන්ගෙන් අදහස් විමසීමේදී ඔවුන්ට කරුණු නිවැරදි ලෙසින් මතක නොතිබීමට හෝ වෙනත් අයගේ අදහස් වලින් බලපෑම් වී සිටීමට වඩාත් ඉහළ හැකියාවක් ඇති බැවින්, දරුවන්ගෙන් විමසා ලබාගන්නා තොරතුරු ඉන් අනතුරුව නිල මූලාශ්‍ර සහ වෙනත් මූලාශ්‍ර මගින් විමසා තහවුරු කරගත යුතු වේ.

ඒ අනුව,

1) මෙම චෝදනාව සම්බන්ධයෙන්, මෙම ලිපියේ අදාළ දරුවන්ගේ අදහස් දැක්වීම් වලට අමතරව, වෙනත් නිල මූලාශ්‍ර ඔස්සේ ද කරුණු තහවුරු කර ගැනී තිබේද?

2) මෙම චෝදනාව 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සම්බන්ධයෙන් තවත් අයවලුන්ද ඉදිරිපත් කරන්නේ දැයි කරුණු සොයා බැලී තිබේ ද?

ඔබේ අදහස?

මූලාශ්‍ර:
https://www.unicef.org/eca/media/ethical-guidelines
https://files.eric.ed.gov/fulltext/ED558564.pdf

මේ පිළිබඳ අප මින් පෙර ඉදිරිපත් කළ පෝස්ටුවට
සබැඳිය: **https://www.facebook.com/ethicseye/videos/522349412341724/**